***ISBN 978-955-4563-72-8***

# පුද්ගල ආකල්ප සංවර්ධන ක්‍රියාවලිය සඳහා ජන කවියේ බලපෑම: අනුරාධපුර දිස්ත්‍රික්කයේ මානෑව ග්‍රාමයේ ජනකවිවලට විශේෂිතව

**දිනීෂා ලියනගේ**

**ස්ත්‍රී පුරුෂ සමාජභාවී අධ්‍යයන කේන්ද්‍රය**

**සංක්ෂේපය**

**ආකල්පයක් යනුවෙන් හැඳින්වෙන්නේ යමක් පිළිබඳව දරන අදහස ලෙස සරලව අර්ථකතනය කළ හැකිය.ඒ ඒ පුද්ගල මට්ටම් අනුව ආකල්පය හොඳ හෝ නරක විය හැකිය. යහපත් හෝ අයහපත් විය හැකිය. ආකල්ප යහපත් හෝ අයහපත් කිරීමට සෑම විටම ඕනෑම මාධ්‍යයට හැකියාවක් ඇත. ආකල්ප වෙනස් කිරීමේ මාධ්‍ය අතර පැරණි සමාජයේදී ජනශ්‍රැතියටහිමි වන්නේ ප්‍රමුඛස්ථානයකි. සංස්කෘතික උරුමයන් ගෙන හැර පෑමට ජනශ්‍රැතිය සතු වන්නේ සුවිශේෂී හැකියාවකි. එහිදී ජනකවිය යනු ඉතා අපූර්ව වූ සංවේදී කලා මාධ්‍යයකි. මෙමඟින් මූලික වශයෙන්ම අවධානය යොමු කරනු ලබන්නේ ආකල්ප සංවර්ධන ක්‍රියාවලිය සඳහා මානෑව ග්‍රාමයේ ජනකවිවල බලපෑම කෙබඳුද යන්න විමර්ශනය කිරීම සඳහායි.**

## හැඳින්වීම

පුද්ගල ආකල්ප සංවර්ධනය උදෙසා භාවිත කරන විවිධ මාධ්‍ය අතර ජන කවියට හිමි වන්නේ ප්‍රමුඛස්ථානයකි. යම් කෙනෙක් යම් දෙයක් හෝ යමක් පිළිබඳව දරන්නා වූ අදහස ආකල්ප වශයෙන් සරලව අර්ථකතනය කළ හැකිය. යම් කෙනෙකු තුළ පවතින මානසික ස්ථාවරය එක් අතෙකින් ආකල්පයකි. එය සමාජය තුළ යහපත් මෙන්ම අයහපත් පාර්ශවයෙහිලා හඳුනාගත හැකිය. ඕනෑම පුද්ගලයකු සිය ජීවන දැක්මට අනුගත වෙමින් මෙකී ආකල්පමය රාමුව සකස් කරගැනීම සිදු කරනු ලැබේ. ප්‍රජානන සාධක මෙන්ම සංස්කෘතික සාධකයන්ද මෙකී ආකල්ප සකස්වීමේ ක්‍රියාවලියේදී සෘජුවම හෝ වක්‍ර මාර්ගිකව බලපෑම් කරයි. ජන කවිය යනු නිර්ව්‍යාජ ගැමි ජනයාගේ සතුටේත්, කඳුලේත්, සිනහවේත්, සන්නිවේදන මාධ්‍යයයි. නිර්මාණශීලී ගුණය අතින් ගත් කළ ජන කවිය ගැමි ජනයාගේ පරිනත බුද්ධිගෝචර මට්ටම හැඳින්විය හැකි බුද්ධිමත් බවේ සංකේතයකි. නැවත නැවත ඉපදීමේ ගුණය නිසා මෙන්ම එහි පවතින තත්කාලීන සමාජ සංස්ථාවේ ස්වරූපය මැනවින් විවරණය කිරීමේ හැකියාවත් ජන කවිය සතු ලක්ෂණයයි. නන්දසේන රත්නපාලයන්, ජනතාවගේ හැඟීම් අභිප්‍රායන් ආකල්ප පෙන්වා දෙන හොඳම කැඩපත ලෙස ජන කවිය දකින්නේ එබැවිනි. අනුරාධපුර දිස්ත්‍රික්කයේ මානෑව ග්‍රාමය යනු අලිඛිත ජන කවි පවතින ප්‍රදේශයකි. එම ජන කවි අධ්‍යයනයේදී පෙනී යන්නේ ගැමි ආකල්ප ඉතා සියුම්ව විවරණය කරන්නට එම ප්‍රදේශයේ ජනකවිවල පවතින හැකියාවයි. මිනිස් වර්ගයක් පිළිබඳ හෙලා දැකීම හෝ පහත් ආකල්පයක් ඇති කිරීමට ඔවුන් උත්සාහ ගෙන නැති ආකාරය මානෑව ග්‍රාමයේ ජන කවි අධ්‍යයනයේදී තව දුරටත් තහවුරු වෙයි.

## ආකල්ප

ආකල්ප නම් වූ සන්දර්භය පිළිබඳ විශ්ලේෂණය කිරීමේදී ඒ පිළිබඳ විවිධ විද්වතුන් විසින් සිදුකොට ඇති නිර්වචන විග්‍රහකිරීමඉතාමත් වැදගත් වේ.


'' ආකල්ප යනු පුද්ගලයකු යම් වස්තුවකට හෝ අවස්ථාව තුළ ප්‍රතිචාර දැක්වීමේදී, මගපෙන්වනු ලබන හෝ ගතික බලපෑමක් ඇති කරනු ලබන අත්දැකීම් තුළින් සංවිධානය වන මානසික හා ස්නායුමය සූදානම පිළිබඳ තත්ත්වයකි.- ඕල්පොට් (Allport G.W1935)

එසේම ෆිෂ්බීන් සහ අජ්ෂෙන් (Fishbein & Ajsen 1975) අනුව ආකල්පයන්,

1. ඉගෙනීමෙන් ඇතිවන බව
2. ක්‍රියාකාරීත්වයට පූර්ව නැම්මක් සැපයීම
3. හිතකර හෝ අහිතකර ලෙස බලපෑම, යන අංග 3න් යුක්ත වූවකි.

***ISBN 978-955-4563-72-8***

ආකල්පයන් ද්විධ්‍රැව සිවභාවයකින් එසේත් නැතිනම් යමකට එකග නොවීමේ ලක්‍ෂණයෙන් යුක්ත වේ. ඒ තුළ යමකට කැමති වීම හෝ අකමැති වීම තීරණය කරන සාධකයක් ලෙසද මෙම තත්ත්වය හඳුනාගත හැකිය.




ආකල්ප මැනීමේදී එහෙත් නැතිනම් ආකල්ප ගුණාත්මක වශයෙන් ඇගයීමේදී මේ සිද්ධාන්තය වැදගත්ය. ආකල්පයට පැහැදිළි යොමුවක් ලැබෙන්නේ මෙම හොඳ නරක ස්වභාවය මත හෝ එහි පවතින මධ්‍යස්ථ ස්වරූපය මතයි.

ආකල්පයන් ගොඩනැගීමට ඉවහල් වන ඉතා කුඩාම ඒකකය වන්නේ අතීත අත්දැකීම් යැයි කිවහැක. ඒ ඇසුරෙන් ආකල්පයක් ගොඩනැගීමට ඉවහල් වන සාධකය මෙසේ වර්ගීකරණය කළ හැකිය.
-අබේපාල රෝලන්ඩ්, ආකල්ප සංවර්ධනය-

01. අදහස් (Ideas)

02. අතීත අත්දැකීම් (Past Experience)

03. ස්ව සංකල්ප(Self Concept)

04. යුතුකම් හා වගකීම් (Obligations)

05. අරමුණු (Objectives)

06. මනෝභාව (Sentiments)

**ජන කවිය**

ජන කවිය ජනතාවගේ හැඟීම් දැනීම් ඉතා සංයමශීලීව ඉදිරිපත්කළ අපූරු මාධ්‍යයක් විය. "ජනකවිය වනාහි නූගත් ගැමියාගේ සිතහවේත් කඳුළේත් ප්‍රති මූර්තියයි" - නන්දසේන රත්නපාල-මානෑව ග්‍රාමයේ ජන කවි පිළිබඳ අවධානය යොමු කිරීමේදී එම ජන කවි මෙම උක්ත සඳහන් කළ ආකාරයට ගැමි ජනයාගේ අත්දැකීම් ඇසුරින් නිර්මාණය වී ඇති ආකාරය හඳුනාගත හැකිය.ජනකවියා ස්වකීය සතුට පමනක් නොව කඳුළද කවියට නැගුවේය. ජන කවිවල පවතින්නේ නිර්ව්‍යාජ නිස්කලංක වූ සන්නිවේදනයකි. එය ඇතැම්විටෙක අධ්‍යාපනික විනෝදාස්වාද මාධ්‍යයක් තරමටම ප්‍රබලය.නිර්මාණශීලීය. "ජනකවිය කලාවකි එය සියුම් ලෙස සකස් වුනු කාව්‍ය සම්ප්‍රධායකි ජාතික සංස්කෘතියට සභ්‍යත්වයට ගැමි බසට ආලෝකයක් වූ පැරණි ගැමියා අතර පැවති නා නා දේ පිළිබඳව නොයෙක් අයුරින් කලඑළි වූ පැදි ජන කවි නම් වෙයි. ගැමියාගේ සිත් සතන් තුළ ජනිත වූ නිදහස් අදහස් හා සිතුම් පැතුම් දුක් වේදනා ආදිය ප්‍රකාශ කිරීම උදෙසා පුරාතනයේ සිටම සරලව රසාලිප්තව මෙමඟින් ඉදිරිපත් කෙරේ".-කුමාරි චාමිනී, සම්භාෂා- ජන කවිය යනු සාමාන්‍ය ජනතාව අතරින් උපන් නිර්ව්‍යාජ කලා මාධ්‍යයක් බව මැනවින් සුපැහැදිලිය.

**මානෑව ග්‍රාමය**

ඓතිහාසික තොරතුරුවලට අනුව රත්නාවලී බිසවගෙන් නෑකම් ඇති මානෑව ග්‍රාමය මහානාම රජුගෙන් පැවත එන්නක් වන අතර රාජකරුණා පරපුරේ පෙලපත් නාමයට අයත්ය. භූගෝලීය සාධකවලට අනුව අනුරාධපුර දිස්ත්‍රික්කයට අයත්ව ඉපලෝගම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාෂයේ උතුරු කලාගම් පලාතේ මානෑව ග්‍රාමය පිහිටා ඇත.

***ISBN 978-955-4563-72-8***

**පුද්ගල ආකල්ප සංවර්ධනය විෂයෙහි මානෑව ග්‍රාමයේ ජන කවි**

මානෑව ග්‍රාමයේ ජන කවි පිළිබඳව අධ්‍යයනය කිරීමේදී එම ජනකවි නිර්මාණය කිරීම සඳහා හේතු කාරක වූ හේතු සාධක කීපයක් ලසුකොට දැක්විය හැකිය.

1 තොරතුරු රැස් කර ගැනීම

2 අත්දැකීම් ප්‍රකාශනය

3 විනෝදාස්වාදය

4 වටිනාකම් හෝ ධර්මතාවයන් පරම්පරාවෙන් පරම්පරාවට රැගෙන යාම

5 පුද්ගලාන්තර සන්නිවේදනය

6 අධ්‍යාපනය ලබා දීම

ඵලදායි සන්නිවේදනය පුද්ගලයින් තුළ ආකල්ප ස්ථාපිත වීමේ ජනප්‍රිය සිද්ධාන්තයකි. යමක් ඉතා මැනවින් ඵලදායි ලෙස සන්නිවේදනය වන්නේ නම් අපට අවශ්‍ය ආකල්ප මැනවින් සිත්තුළට ඇතුලත් කිරීම කළ හැකිය. මෙම ක්‍රියාවලිය උදෙසා ජන කවිය ප්‍රබල ඵලදායි සන්නිවේදන මාධ්‍යයක් වශයෙන් හඳුන්වා දිය හැකිය. පැරණි සමාජය තුළ මෙම ආකල්ප සංවර්ධන කාර්යයේ ප්‍රබල සන්නිවේදන මෙහෙවර සිදු කරන ලද මාධ්‍ය ජනකවියයි.

මානෑව ග්‍රාමයේ පිහිටීම සහ මානෑව වැව පිළිබඳව ගැමියන් කෙරෙහි පවතින්නේ පුදුමාකාර ගෞරවාන්විත ආකල්පයකි. එය අතීතයේ සිටම ඔවුන්ට උරුම වන යහපත් ආකල්පමය චින්තනය විවර කරන්නකි.

අපේ වැවේ වැකන්දෙන් පලයල්ලා
සොඳ සොඳ නෙළුම් බටු තෝරා කාපල්ලා
දෝත පුරා පැන් අරගෙන බීපල්ලා
අපේ වැවේ බැම්මට පින් දීපල්ලා

රන්වන් දිය කඳයි බොල අර දිලෙන්නේ
දෙවියෝ දීපු මානෑ වැව බොලන්නේ
ඇසිපිය හෙලන හැම වාරෙම හිතෙන්නේ
මානෑ වැවට හැමවිට පින් දියන්නේ

ප්‍රජානනය පුද්ගලයාගේ අදහස්, මත, රුචිකම්, විශ්වාස, වටිනාකම් වශයෙන් පහළ විය හැකි මානසික ස්වභාවයකි. ඊට අමතරව චර්යාමය බලපෑම් සහ සමාජමය බලපෑම් ද ආකල්ප සංවර්ධනය සඳහා බලපෑම් ඇති කරයි. එම මූලික සාධක තුන එනම් ප්‍රජානනය, චර්යාමය හා සමාජමය යන බලපෑම් සමාජහිතකාමී දෙසට නැඹුරුව සංකලනය විම තුළින් ආකල්ප සංවර්ධනය වීමක් සිදු වේ. පැව්ලොවාගේ සම්භාව්‍ය ආරෝපන න්‍යායට අනුව අවශ්‍ය ආකල්ප පුද්ගලයා තුළ ආරෝපනය කිරීමේදී යම් ප්‍රබෝධයක් ඉදිරිපත් කරමින් ඊට ප්‍රතිචාර ලෙස ජනවාර්ගික සුහදතාවය, අන්‍යෝන්‍ය ගෞරවය වැනි ආකල්ප ආරෝපනය කරනු ලැබේ. මේ අන්දමේ ක්‍රියාකාරී විනෝදාත්මක වැඩසටහන් ප්‍රබෝධමත් කොට ඒවාට ප්‍රතිචාර දැක්වීම තුළින් එය සිදු කළ හැකිය. එක් අතෙකින් ජන කවිය යනු විනෝදාස්වාදය සපයන මාධ්‍යයකි. කලාවේ උපත ජන ජීවිතය හා සම්බන්ධ වන්නට ඇතැයි යන මතය පිළිබඳ අදහස සමඟ ජනකවිය අධ්‍යයනයේදී එකඟ විය හැකිය. එයට හේතුව ජන කවිය අතිශය ප්‍රබෝධමත් මෙන්ම අතිශය නිර්මාණශීලීව පුද්ගලයා කෙරෙහි ආකල්ප ඇති කළ හැකි මාධ්‍යයක් වශයෙන් හඳුනාගත හැකි වීමයි.

මානෑවේ ජන කවි කොරහි අවධානය යොමු කිරීමේදී

- ජය පැරඳුම දරා ගැනීමේ හැකියාව වර්ධනය කිරීම
- සහයෝගය
- සමගිය

ISBN 978-955-4563-72-8

- කණ්ඩායම් සහයෝගය වර්ධනය යන ආකල්පයන් කෙරෙහි අවධානය යොමු කර තිබේ. මෙහි පවතින විශේෂත්වය ප්‍රබෝධමත් බව යන සාධකය ඔස්සේ ආකල්ප සංවර්ධනයයි.

සිග්මන් ෆ්‍රොයිඩ්ගේ මනෝ විශේලේෂණ වාදයට අනුව ළදරු කළ සිටම '' ජීවත් වීමේ ආශාවන්'' මනුෂ්‍යයා තුළ හට ගනී. එහි ප්‍රතිඵලයක් ලෙස අවශ්‍යතා සංතෘප්ත කර ගැනීම මනුෂ්‍යයාගේ ඒකායන පරමාර්ථය වේ. ඒ නිසා ආකල්ප ස්ථාපිත කිරීමේ ක්‍රම ශිල්පයක් ලෙස අවශ්‍යතා ඉටු වීම හෙවත් තෘප්තිමත් වීමේ සංකල්පය දැක්විය හැකිය. එනම් අවශ්‍යතා ඉටු වීම හෝ නොවීම මත ධන හෝ සෘණ ආකල්ප පහළ වේ. එහිදී හට ගන්නා ආකල්ප ඉතා හොඳ හෝ ඉතා නරක මට්ටම දක්වා වර්ධනය වීම සිඳු වෙයි. එය මානෑවේ ජන කවියෙන් නිරූපණය වන්නේ මෙසේය.තම බිරිඳගේ පළමු දරු උපත සිඳුවීම නිමිති කොට ගෙන ඇය දෙමාපියන්ගේ නිවසට ඇරලීමට යාමේදී සිදුවන විපත හේතු කොට ගෙන සෘණ ආකල්ප උද්දීපනය වීම මෙම ජන කවියෙන් විවරණය වෙයි.

පොල් හින්දේ තෙල් වැඩකට නොගන්නද
බත් බැන්දේ දැකලා බඩ පිරෙන්ඩද
මල් බැන්දේ කඩු බුලතේ රැදෙන්ඩද
කල් බැන්දේ මීමාගෙන් නසින්ඩද

ඉතිරෙනවා සේමැයි බත් හැලිය ලිපේ
අකුලනවා සේමැයි පැදුර අතේ
මතුරනවා සේමැයි සැමියාගේ හිතේ
පනයනවා සේමැයි හිමියාට දුකේ

අඹෙන් උපන් පත්තිනි හාමුදුරුවනේ
තඹෙන් තැනූ ලෝ සලඹේ අනුහසිනේ
උතුම් පඬි රජුගේ නලලේ නෙත මැකුනේ
තදින් ගිනි හෙනක් මීමට දෙවන් අනේ

ආකල්ප ධනාත්මක මට්ටමේ සිට සෘණාත්මක මට්ටමට ලඟාවන විට පුද්ගලයා ප්‍රකෝපකාරීය. එය දුක වේදනාව සාංකාව යන මානසික හේතුන් සමග සම්බන්ධ වෙයි. ගැමියා බිරිඳගේ මරණය තුළ සාංකාවට පත් වී "මීමාට" මරණය යදින්නේ එනිසාය. විරහව පිළිබඳ පුද්ගලයා සතුව පවතින ආකල්ප ඕනෑම සමාජයක ඉතා අයහපත් මට්ටම දක්වා ක්‍රියාත්මක වෙයි. මානෑවේ තරුණයා එම ආකල්ප දරා ගත් ආකාරය මෙම ජනකවියෙන් නිරූපිතය.

කොට්ට උනත් තෙල් හිඟ නැත පොල් ගෙඩියේ
මල් බැන්දත් සුවඳක් නැත හක් ගෙඩියේ
දිය බැන්දත් මෙලෙකක් නැත ගල් ගෙඩියේ
කල් බැන්දත් විස්වස නැත නපුරු ලියේ

උඹට එක් වෙන්ඩ මම කරපු වැයම්
උඹට එක් වෙලා මට මොටද නෑයම්
ගිනි දල්ලේ අග බඳිනා වේයන්
හැට හතරක් ඇත ගෑණුන්ගෙ මායම්

ගැමි විශ්වාසය තුළ උල ලේනා යනු අභාග්‍යයේ සංකේතයයි. උල ලේනාගේ හැඬීම මරණයේ සංකේතයයි. උල ලේනා කෑ ගසන විට එම සතා උදෙසා මුඛ බන්ධනය කරන්නට ආවේගශීලී වූ වැසියෝ ටික වේලාවකට පසු මුඛ බන්ධනය හැර සත්වයා එයින් නිදහස් කරන්නට තරම් යහපත් ආකල්ප දැරූහ.

<u>උල ලේනාගේ මුඛ බඳින කවි (වෛරී ආකල්ප)</u>

මන්දා කිකිණි හැඬුවා වැනි එසත් වට
කැමොර දීදී හැඬුවා උෆ ඉපල් පිට
සිව්වරම් දෙවියො සිහිකර කියන විට
මම අද බඳිමි උල ලේනගේ මකර කට

ISBN 978-955-4563-72-8

උඩින් යන්න උඩ යොතනක් බැඳීයන්
බිමින් යන්න බිම යොතනක් බැඳීයන්
යොත්න දෙකම එක යොත්නට බැඳීයන්
උල ලේනිගේ රහ දිව මුඛ බැඳීයන්


<u>උල ලේනාගේ මුඛය අරින කවි (අවිහිංසාවාදී ආකල්ප)</u>

උඩින් යන්න උඩ යොතනක් ඇරීයන්
බිමින් යන්න බිම යොතනක් ඇරීයන්
යොත්න දෙකම එක යොත්නට ඇරීයන්
උල ලේනිගේ රහ දිව මුඛ ඇරීයන්

මේ අනුව පෙනී යන්නේ මෙම ගැමි ජනයා වාචික හිංසාව පවා සමාජයෙන් තුරන් කර ඇති ආකාරයයි. තමාට හිමිවිය යුතු නැනා වෙන පුරුෂයකු සමඟ ප්‍රේම සම්බන්ධතාවයක් ඇති කර ගැනීම, විවාහ වීම මස්සිනාට වාවා ගත නොහැකි දුකක් වන්නේ නිරායාසයෙනි. නිබඳවම ඒ දැනෙන විරහව ඔස්සේ තරහ පිළිබඳ ආකල්ප වෙනුවට තම නැනාගේ සතුට පමණක් පැතීමට තරම් මානැවේ තරුණයාගේ ආකල්ප හෘදයාංගම විය.

මගෙ සිත අරන් නැනෝ නුඹ ගිය දවසේ
මගෙ බඩ පපුව දනවා මේ දැන් එකසේ
හදවත ඇතුලෙ රිදුමක් ගෙන දෙයි බෝසේ
පැතුමක් පතමි ජය වේවා මතු දවසේ

පරමාදර්ශී චරිත ඔස්සේ ආකල්ප ගොඩනගා ගැනීමද පුද්ගල ස්වරූපයයි. පරමාදර්ශී චරිත යනු සමාජයේ කැපීපෙනෙන හෝ නායකත්ව භූමිකා දරන විවිධ චරිත හා ආකෘතින්ය යන්න රෝලන්ඩ් අබේපාල සිය ආකල්ප සංවර්ධනය කෘතියේදී හඳුන්වා දෙයි. පරමාදර්ශී චරිත භාවිතය ඔස්සේ ආකල්ප සංවර්ධනය උදෙසා මානැවේ ජනකවියා ජන කවිය භාවිතයට ගෙන තිබේ. එහිදී ඔවුන්ගේ පරමාදර්ශී චරිත ගොඩනැඟී ඇත්තේ සම්පූර්ණයෙන්ම ආගමික පරිසරය කේන්ද්‍ර කොට ගෙනය.




බුදුන් දිශාවටමයි හිස නමන්නේ
පිං දී වඩින්නට කියලයි කියන්නේ
මතු බුදු වෙන්ඩ ඇති උතුමෙකි බොලන්නේ
සංගං සරණ වැඳ සිව්පද කියන්නේ

***ISBN 978-955-4563-72-8***

වකුටු වෙලා සැරමිටි ගෙන යන කලට
රකුසු උඩ බලා පඩි රජ නෙත මකන
කොපුදුන් ඊතලෙන් අඹ යුධයට විදින
කකුසඳ මුනිඳු වැඳලා මම වරං ගෙන

රන්වන් ලියේ නෙලනට පෙර කුරක්කන්
සිහිකර ගන්ට සිත යට සරණම තෙරුවන්
දෙවිවරු සැමත් සිහිකර ගන්ටකෝ ඉතින්
ඉන්පසු කපන්නට අවසර ඇත කුරක්කන්

නමෝ නමෝ පළමුව බුද්ධං සරණ
නමෝ නමෝ දෙවනුව ධම්මං සරණ
නමෝ නමෝ තෙවනුව සංඝං සරණ
නමෝ නමස්කාරෙන් සිව්පද පුරණ

මානෑ ගලට ඉර දෙවියන් වඩින්නේ
සැඳෑ කලට සඳ දෙවියන් වඩින්නේ
මානෑ ගලේ ලස්සන මේ දකින්නේ
මානෑ ගලයි මානෑවම රකින්නේ

මානෑවේ ගලදෝ අර පෙනෙන්නේ
ගල මුදුනේ රන් කොඩියක් වැනෙන්නේ
රන් කොඩියේ රන් ගිරවකු ලඟින්නේ
මානෑවේ දෙවියෝ අප රකින්නේ

පරමාදර්ශී චරිත ඔස්සේ යහපත් ආකල්ප උද්දීපනය කිරීමට මෙහිදී ජනකවියා උත්සුක වී තිබේ.

''සිත් ඇදගන්නා සුළු බව'' ආකල්ප පරිවර්තනය සිදු කරන මාධ්‍යයකට අත්‍යාවශ්‍ය අංගයකි. ආකල්පයක පරිවර්තනය සිදු වන ප්‍රමාණය පරිවර්තන මාධ්‍යයේ සිත්ඇදගන්නා සුළු බව මත රඳා පවත්නා බව ටැනන්බොම් ( Tananbaum - 1956) රොජර්ස් (1978) යන විද්වතුන් පෙන්වා දුන්නේය.

ජනකවිය සතුව පවතින නිර්ව්‍යාජ බව මෙන්ම එහි පවතින සරල භාෂාවත් තුළ මෙම සිත් ඇදගන්නා සුළුබව හඳුනාගත හැකිය. කෘෂිකාර්මික ජන ජීවිතයක් ගත කළ අප ආදීතමයෝ ඖෂධ වර්ග, සිරිත් විරිත් ආහාරපාන වර්ග, පවා තවත් පරම්පරාවකට සන්නිවේදනය කළේ මුඛ පරම්පරාගතවය. ජන කවිය මෙම ක්‍රමයේ සිත් ඇඳගන්නා සුළු මාධ්‍යයකි. ස්වකීය රැකියා භූමිකා සිත් ඇඳ ගන්නා සුළුව වර්ණනාත්මකම ඉදිරිපත් කිරීම ඔස්සේ එකී රැකී රක්ෂා පිළිබඳව තම පිරිස අතර යහපත් ආකල්ප ඇති කිරීමට ඔවුන් ක්‍රියා කර තිබෙන ආකාරය මානෑවේ ජන කවි අධ්‍යයනයේදී පෙනී යන ප්‍රධානතම ලක්‍ෂණයයි.

- පත් නෙලීමට කුඹුරට යන ආකාරය
- පත් නෙලීමට පෙර අවසර ගැනීම
- පත් නෙලන ආකාරය
- පත් වියලා ගන්නා ආකාරය
- පත් පැහැ ගන්වන ආකාරය
- පැඳුර වියන ආකාරය
-

ආදී වශයෙන් වෘත්තිය පිළිබඳ නිර්මාණශීලීව අදහස් ජනිත කිරීමට මෙහිදී ජන කවියා උත්සුක වී ඇත.

ISBN 978-955-4563-72-8

නැන්දට බලන්ඩට පැඳුරක් වියෑද්දෑයි
ඉසට පියුම්ලා පැඳුරක් වියෑද්දෑයි
පයට පියුම්ලා පැඳුරක් වියෑද්දෑයි
මැදට ඇඳ රටා පැඳුරක් වියෑද්දෑයි

පැඳුරේ ඉහත්තේ ඉර දෙවියන් වසතී
පැඳුරේ පයානේ මිහිකත දෙවි වසතී
පැඳුරේ සිව්කොනේ සිව්වරන් දෙවි වසතී
මේ පැඳුරේ සැතපී ඉන්ට බය නැතී

තත් සමාජ සංස්ථාවේ සාධනීය ලක්ෂණ මෙන්ම නිශේධනීය ලක්‍ෂණයන් හෙළි පෙහෙළි කරන ජන කවිය ගැමි ජනයාගේ සිනහවේත් කඳුලේත් සංකලනයක් ලෙසින් හැඳින්විය හැකිය. "නානායක්කාර, ගුණවර්ධන. ජනකාව්‍ය සාහිත්‍ය සමීක්ෂා"මානෑවේ ජනකවි පිළිබඳව අවධානය යොමු කිරීමේදී පෙනී යන ප්‍රධානතම ලක්ෂණය වන්නේ ආකල්ප සංවර්ධන කාර්ය සඳහා ජන කවිය ප්‍රබල බලපෑම් කාරකයක් ලෙස ක්‍රියාත්මක වන බවයි. එහිදී යහපත් මෙන්ම අයහපත් වශයෙන්ද ආකල්ප ඇති කිරීම උදෙසා ජනකවිය භාවිතයට ගෙන ඇත.

## නිගමනය

ආකල්ප සංවර්ධන ක්‍රියාවලිය සඳහා ජන කවිය ප්‍රබල සන්නිවේදන මාධ්‍යයක් වශයෙන් හඳුනාගත හැකිය. හොඳ සහ නරක යන අන්ත දෙක කෙරෙහිම ජනකවිය ඔස්සේ ආකල්ප හට ගැන්වීම ක්‍රියාත්මක වී ඇති ආකාරය මානෑවේ ජනකවි අධ්‍යයනයෙන් පෙනේ. ස්වකීය නිර්මාණශීලී සරල භාෂාව භාවිතයෙන් තත් කාලීන සමාජ සංස්ථාවේ ආකල්ප සමාජගත කිරිමට ජන කවියා උත්සුක වී ඇත.

## ආශ්‍රිත ග්‍රන්ථ

අබේපාල, රෝලන්ඩ්. (2005). *ඉගෙනුම පිළිබඳ මනෝ විද්‍යාව ආකල්ප සංවර්ධනය.* දයාවංශ ජයසිංහ ප්‍රකාශනඃ කොට්ටාව.
අමරසිංහ, නන්දනී. අශෝකා. (2000). *ආකල්ප.* ශික්‍ෂා මන්දිර ප්‍රකාශනඃ පානදුර.
බඳගිරියේ, සිරිනන්ද ස්ථවිර. (2010). *මිනිස් චර්යාවේ මනෝවිද්‍යාත්මක පැතිකඩ.* කර්තෘ ප්‍රකාශන.
කහඳගමගේ, පියසේන. (1999). *හේනේ විත්ති.* ගොඩගේ සහ සහෝදරයෝඃ කොළඹ.
නන්දසේන, රත්නපාල. *ජනශ්‍රැති විද්‍යාව.* ගොඩගේ සහ සහෝදරයෝඃ කොළඹ.
Russel, C. Ivan. (2000). *Attitudes and Attitude Change*. Southern Illinois University.
Thomas, Kerry. (1971). *Attitudes and Behaviors*. England: Penguin Books LTD.

## උප ග්‍රන්ථ

| ජනකවි ලබාගත් දත්තදායකයන්ගේ නාම ලේඛනය | | |
|---|---|---|
| | **දත්තදායකයාගේ නම** | **ලිපිනය** |
| 1 | රාජකරුණා මුදියන්සේලාගේ හීන් බණ්ඩාගේ චන්ද්‍රසේකර | 502, මානෑව තුලාව (අනුරාධපුරය) |
| 2 | ඕවිටිපහන වලව්වේ ඕ. ඩබ්. ඩී. ඒ ඕවිටිපහන | |
| 3 | රාජකරුණා මුදියන්සේලාගේ කපුරාළගේ ප්‍රේමාවතී රාජකරුණා | |
| 4 | ටිකිරි බණ්ඩාගේ සෝමාවතී | |
| 5 | තේවාහාමිගේ ලීලාවතී | |
| 6 | කීරාළගේ ලීලාවතී | |
| 7 | කීරාළගේ පොඩිනෝනා | |
| 8 | ටිකිරි බණ්ඩාගේ පොඩිහාමි | |
| 9 | රාජකරුණා මුදියන්සේලාගේ සෝමාවතී | |
| 10 | ඕවිටිපහන වලව්වේ පුංචිබණ්ඩා | |
| 11 | රාජකරුණා මුදියන්සේලාගේ කපුරාළගේ ජයපාල | |
| 12 | කීරාළගේ පොඩි සිංඤෝ | |
| 13 | ටිකිරි බණ්ඩාගේ මාර්ටින් සිංඤෝ | |
| 14 | රාජකරුණා මුදියන්සේලාගේ කපුරාළගේ පීතර රාජකරුණා | |